සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 11 | විෂයය / பாடம் / Subject: ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper I,II | කාලය / காலம் / Time: පැය 03 |

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

- **පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

නිර්මාණවේදී උපාධිධාරිණියන් වන අමාෂි සහ හිමාෂි සමව ප්‍රාග්ධනය යොදවමින් ''මාෂි නව විලාසිතා නිපයුම්'' නමින් කාන්තා නිමි ඇඳුම්, පාසල් නිල ඇඳුම් මසා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් නාගරික කාර්යාල සංකීර්ණයක් අසල පිහිටි අමාෂිගේ නිවස ඉදිරිපිට ඇති ගොඩනැගිල්ලේ ආරම්භ කිරීමට තීරණය කරන ලදි.

(01) මෙම සිද්ධියේ සඳහන් ''මාෂි නව විලාසිතා නිපයුම්'' ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික අවශ්‍යතාවය කුමක් ද?
(1) ආහාර (2) ඇඳුම් (3) නිවාස (4) ආරක්ෂාව

(02) ඉහත සිද්ධියේ සඳහන් මෙම ව්‍යාපාරයේ අවස්ථාවක් වනුයේ,
(1) දෙදෙනාම සමව ප්‍රාග්ධනය යෙදීමය.
(2) අමාෂි හා හිමාෂි නිර්මාණවේදී උපාධිධාරිණියන් වීමය.
(3) ව්‍යාපාරය, නාගරික කාර්යාල සංකීර්ණයක් අසල පිහිටා තිබීමය.
(4) අමාෂිගේ නිවස ආසන්නයේ ව්‍යාපාරය පිහිටා තිබීමය.

(03) මෙම සිද්ධියේ සඳහන් 'මාෂි නව විලාසිතා නිපයුම්' ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
(1) හවුල් ව්‍යාපාර (2) ඒක පුද්ගල ව්‍යාපාර
(3) සංස්ථාපිත සමාගම් (4) සමිති සංවිධාන

(04) ''මාෂි නව විලාසිතා නිපයුම්'' ව්‍යාපාර නාමය ලියා පදිංචි කළ යුතු බලධරයා කවුරුන් ද?
(1) සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයා ය (2) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා ය
(3) ප්‍රදේශීය ලේකම් වරයා ය (4) පළාත් සභා ව්‍යාපාරනාම රෙජිස්ට්‍රාර්වරයා ය

(05) මෙම සිද්ධියේ සඳහන් ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙම ව්‍යාපාරය කොටස් නිකුත්කර ප්‍රාග්ධනය රැස්කරයි.
(2) මෙම ව්‍යාපාරයේ වගකීම සීමිතය.
(3) මෙය භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.
(4) මෙය සේවා නිෂ්පාදන ව්‍යාපාරයකි.

(06) කොටස් හිමියන්ගේ වගකීම සීමිත ව්‍යාපාර ......... ලෙස හඳුන්වන අතර ....... ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සහිත පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයකි.


ඉහත ප්‍රකාශයේ (1) සහ (2) යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) සංස්ථාපිත සමාගම්, සමූපකාර
(2) හවුල් ව්‍යාපාර, සමූපකාර
(3) ඒක පුද්ගල ව්‍යාපාර, සමිති සංවිධාන
(4) සංස්ථාපිත සමාගම්, හවුල් ව්‍යාපාර

(07) බාහිර පරිසරය සම්බන්ධ පහත ප්‍රකාශ අතුරෙන් එකක් සාවද්‍ය වේ. එම සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) ව්‍යාපාර, මිල දර්ශන ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය වේ.
(2) වර්තමානයේ බැංකු විද්‍යුත් පහසුකම් පුළුල් කර ඇත.
(3) රටේ ඉතුරුම් වර්ධනය වීම ආයෝජන අවස්ථා පුළුල් වීමට බලපායි.
(4) අපනයන ඉක්මවා ආනයන සිදු කිරීම රටකට වාසි සහගත වෙයි.

(08) චෙක්පතක් රේඛන කෙරෙන ආකාර කිහිපයක් පහත දැක්වේ.




ඉහත රේඛන අතුරෙන් විශේෂ රේඛනය පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය කුමක් ද?

(1) A සහ B ය. (2) A සහ C ය.
(3) B සහ D ය. (4) B සහ C ය.

(09) පහත දැක්වෙන්නේ ඉතිරි කිරීමේ සහ ජංගම ගිණුම්වල ප්‍රයෝජන කිහිපයකි.

A - චෙක්පත් මඟින් ගනුදෙනු කළ හැකිවීම.
B - තැන්පතු සඳහා පොලී ආදායමක් හිමිවීම.
C - තැන්පතු සඳහා පොලී ආදායමක් අහිමි වීම.
D - හරපත් මඟින් ගෙවීම් කළ හැකිවීම.
E - බැංකු අයිරා පහසුකම් ලබාගත හැකි වීම.

ඉහත සඳහන් දෑ අතුරෙන් ජංගම ගිණුම්වල ප්‍රයෝජන පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) A, B සහ C ය. (2) A, C සහ E ය.
(3) A, C සහ D ය. (4) A, B සහ D ය.

(10) පහත දක්වෙන්නේ රක්ෂණ මූලධර්ම සහ එම මූලධර්මවලට සම්බන්ධ තොරතුරු කිහිපයකි.

| රක්ෂණ මූලධර්ම | තොරතුරු |
|---|---|
| A - උපරිම විශ්වාසය<br>B - රක්ෂ්‍ය හිමිකම<br>C - හානිපූරණය | 1. ජීවිතයක් හෝ දේපලක් රක්ෂණය කිරීමට ඇති නීත්‍යානුකූල අයිතිය වේ.<br>2. රක්ෂිත දේපලට වූ හානිය යථා තත්ත්වයට පත්කර ගැනීමට සරිලන වන්දියක් ගෙවිය යුතුය.<br>3. දෙපාර්ශවයම ගිවිසුමට අදාළ නිවැරදි තොරතුරු හෙළිදරව් කළ යුතුය. |

ඉහත රක්ෂණ මූලධර්ම සහ තොරතුරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) A - 3, B - 1, C - 2
(2) A - 2, B - 3, C - 1
(3) A - 1, B - 2, C - 3
(4) A - 3, B - 2, C - 1

(11) පහත දක්වෙන්නේ සන්නිවේදන මාධ්‍ය සහ සන්නිවේදන ක්‍රම කිහිපයකි.

| සන්නිවේදන මාධ්‍ය | සන්නිවේදන ක්‍රම |
|---|---|
| A - වාචික<br>B - ලිඛිත<br>C - විද්‍යුත්<br>D - සංඥා සහ සංකේත | 1. ඩිජිටල් පුවරු<br>2. අන්තර් ජාලය<br>3. මාර්ග සංඥා<br>4. සංකේත<br>5. පුවත්පත්<br>6. ලිපි<br>7. රැස්වීම්<br>8. සම්මන්ත්‍රණ |

ඉහත සන්නිවේදන මාධ්‍යයන්, සන්නිවේදන ක්‍රම සමග නිවැරදිව අනුපිළිවෙලින් ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

(1) A - 1 සහ 2, B - 3 සහ 4, C - 5 සහ 6, D - 7 සහ 8
(2) A - 2 සහ 3, B - 4 සහ 5, C - 6 සහ 7, D - 1 සහ 8
(3) A - 7 සහ 8, B - 5 සහ 6, C - 1 සහ 2, D - 3 සහ 4
(4) A - 6 සහ 7, B - 5 සහ 8, C - 1 සහ 2, D - 3 සහ 4

(12) ප්‍රවාහනය සම්බන්ධ පහත ප්‍රකාශ අතුරෙන් එකඟවිය නොහැකි ප්‍රකාශය තෝරන්න.

(1) ප්‍රවාහනය, මූලිකාංග කිහිපයකින් යුත් පද්ධතියකි.
(2) ප්‍රවාහන පිරිවැය ඉහළයාමෙන් භාණ්ඩ මිල පහළයයි.
(3) ප්‍රවාහන මූලිකාංග සංවර්ධනය, ව්‍යාපාරවල කාර්යක්ෂමතාවට හේතු වේ.
(4) ගුවන් ප්‍රවාහනය, පිරිවැය අධික ප්‍රවාහන ක්‍රමයකි.

(13) සුපිරි වෙළඳසල් වර්තමානයේ ජනප්‍රිය වීමට ප්‍රධාන හේතුව වනුයේ,

(1) පාරිභෝගිකයාට ස්වයංසේවා පහසුකම් සලසා තිබීමයි.
(2) ප්‍රධාන නගර ආශ්‍රිතව පමණක් පිහිටා තිබීමයි.
(3) විද්‍යුත් ක්‍රම මගින් ගෙවීම් කිරීමේ හැකියාව තිබීමයි.
(4) වෙළඳසල් දෛනිකව වැඩි කාලයක් විවෘතව තිබීමයි.

(14) සංවිධානකරණයේ කාර්යයකි.

(1) විකල්ප ක්‍රියාමාර්ග තීරණය කිරීම (2) වැඩ බෙදාහැරීම

(3) නායකත්වය ලබාදීම (4) නිවැරදි කිරීම සහ පාලනය කිරීම

(15) පහත දැක්වෙන්නේ අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යවලට අදාළ උපකරණ කිහිපයකි.

A - මෝස්තරය B - ගෙවීම් ක්‍රම

C - බෙදා හැරීම D - ගුණත්වය

E - අංගෝපාංග F - විකුණුම් ප්‍රවර්ධන

G - ප්‍රචාරණය H - ඇසුරුම

ඉහත සඳහන් දෑ අතුරෙන් නිෂ්පාදිත විචල්‍යයට පමණක් අදාළ උපකරණ ඇතුළත් පිළිතුර වනුයේ,

(1) A,B,C සහ D ය. (2) A,C,D සහ E ය.

(3) A,E,F සහ H ය. (4) A,D,E සහ H ය.

(16) පහත දැක්වෙන්නේ ආයෝජන මාර්ග සහ එහි ප්‍රතිලාභයන් කිහිපයකි.

| ආයෝජන මාර්ග | තොරතුරු |
|---|---|
| A - සාමාන්‍ය කොටස්<br>B - භාණ්ඩාගාර බිල්පත් | 1. පූර්ණ ආරක්ෂාවක් මෙන්ම පොලියක් ලැබෙයි.<br>2. සීමා සහිත සමාගම් ප්‍රාග්ධනය රැස් කිරීමට නිකුත් කරයි.<br>3. රජයේ කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා ඉටු කරයි.<br>4. වැඩිමිලට විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ උපයයි. |

ඉහත ආයෝජන මාර්ග සහ ප්‍රතිලාභ නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුරු කාණ්ඩය කුමක් ද?

(1) A - 1 සහ 2, B - 3 සහ 4

(2) A - 1 සහ 3, B - 2 සහ 4

(3) A - 2 සහ 3, B - 1 සහ 4

(4) A - 2 සහ 4, B - 1 සහ 3

(17) පහත සඳහන් ගනුදෙනු අතුරෙන් වත්කම් හා හිමිකම් වැඩි වීමට බලපාන ගනුදෙනුව කුමක් ද?

(1) රු. 20,000ක භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ලබා ගැනීම.

(2) අයිතිකරු තමන් සතු රු. 15,00000 ක මෝටර් රථය ව්‍යාපාරයට යෙදවීම.

(3) බැංකු ණය වාරිකය රු. 10,000ක් මුදලින් ගෙවීම.

(4) රු. 4,000ක රක්ෂණ ගාස්තු මුදලින් ගෙවීම.

(18) ගනුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත දැක්වේ.

$$\frac{\text{වත්කම් (රු.)}}{-6000} = \frac{\text{අයිතිකරුගේ හිමිකම (රු)}}{-600} + \frac{\text{වගකීම් (රු.)}}{-5400}$$

ඉහත ගිණුම්කරණ සමීකරණයේ සටහන් කර ඇති ගනුදෙනුව වන්නේ,

(1) ණය හිමියකු වූ සුදේශ්ට රු. 5400ක් මුදලින් ගෙවීමය.

(2) රු. 6000ක බඩුතොගයක් රු. 5400කට ණයට විකිණීමය.

(3) රු. 600ක පොලී ඇතුළත්ව බැංකු ණය වාරිකය ලෙස රු. 6000ක් ගෙවීම ය.

(4) ණය ගැතියකු වූ රමේෂ්ගෙන් මුදලින් රු. 6000ක් ලැබීමය.

- **අංක 19 සහ 20 යන ප්‍රශ්නවලට පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගනිමින් පිළිතුරු සපයන්න.**

2017.09.30 දිනෙන් අවසන් වූ මාසය තුළ සුරේෂ්ගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| අයිතිකරු ප්‍රාග්ධනය යෙදවීම | රු. 100 000 |
| අත්පිට ගැනුම් | රු. 80 000 |
| මිලදී ගත් සියළු භාණ්ඩ විකුණුම් | රු. 110 000 |
| ගොඩනැගිල්ලක් මිළදී ගැනීම | රු. 40 000 |
| සේවක වේතන ගෙවීම | රු. 8 000 |
| බැංකු ණයක් ලබා ගැනීම | රු. 30 000 |

(19) 2017.09.30 දිනට සුරේෂ්ගේ ව්‍යාපාරයේ මුදල් ශේෂය වන්නේ,
(1) රු. 62 000කි. (2) රු. 112 000කි.
(3) රු. 128 000කි. (4) රු. 132 000කි.

(20) 2017.09.30 දිනට සුරේෂ්ගේ ව්‍යාපාරයේ හිමිකම වනුයේ,
(1) රු. 122 000කි. (2) රු. 130 000කි.
(3) රු. 132 000කි. (4) රු. 140 000කි.

(21) පහත වගුවේ x හා y තීරුවල පිළිවෙලින් ලෙජර් ගිණුම් සහ ගනුදෙනු ලෙජර් ගිණුම්වල සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන් මූලධර්මද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ණයගැති ගිණුම<br>2. ප්‍රාග්ධන ගිණුම | A. වත්කම් වැඩි වීම හර, අඩුවීම බැර<br>B. වත්කම් වැඩි වීම බැර, අඩුවීම හර<br>C. හිමිකම් වැඩි වීම හර, අඩුවීම බැර<br>D. හිමිකම් වැඩි වීම බැර, අඩුවීම හර |

x හා y තීරු අනුපිළිවෙලට ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.
(1) A සහ C ය. (2) A සහ B ය.
(3) B සහ D ය. (4) A සහ D ය.

(22) පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවකි.
රුවිනිට රු. 25000ක භාණ්ඩ තොගයක් ණයට විකිණීම.
ඉහත ගනුදෙනුව සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය සහ මූලික පොත පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) විකුණුම් ඉන්වොයිසිය සහ විකුණුම් ජ'නලය
(2) විකුණුම් ජ'නලය සහ විකුණුම් ඉන්වොයිසිය
(3) ජ,නල් වවුචර් සහ විකුණුම් ජ' නලය
(4) ගෙවීම් වවුචර් සහ විකුණුම් ජ'නලය

(23) ගනුදෙනුවක් සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහනක් පහත දැක්වේ.

ණය හිමි ගිණුම - හර රු. 8 000

මුදල් ගිණුම - බැර රු. 8 000

සිදු වී ඇති ගනුදෙනුව වනුයේ,

(1) රු. 8000ක බඩුතොගයක් ණයට ගැනීමය

(2) ණය හිමියකුගෙන් රු. 8000ක වට්ටම් ලැබීම

(3) ණය හිමියකුට රු. 8000ක් මුදලින් ගෙවීමය

(4) රු. 8000ක බඩු තොගයක් අත්පිට මුදලට ගැනීමය.

(24) පහත දැක්වෙන්නේ ගිණුම් වර්ග සහ ලෙජර් ගිණුම් කිහිපයකි.

| ගිණුම් වර්ග | ලෙජර් ගිණුම් |
|---|---|
| 1. වත්කම් ගිණුම් | A. රක්ෂණ ගාස්තු ගිණුම |
| 2. වගකීම් ගිණුම් | B. මුදල් ගිණුම |
| 3. ආදායම් ගිණුම් | C. ණය හිමි ගිණුම |
| 4. වියදම් ගිණුම් | D. පොලී ආදායම් ගිණුම |

ඉහත ගිණුම් වර්ග සහ ලෙජර් ගිණුම් නිවැරදි අනුපිළිවෙලින් ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

(1) A,C,B සහ D ය. (2) A,B,C සහ D ය.

(3) B,D,C සහ A ය. (4) B,C,D සහ A ය.

(25) තිරුෂිගේ ව්‍යාපාරයේ 2017 නොවැම්බර් 30 දිනට සුළු මුදල් පොතේ විශ්ලේෂණ තීරුවල ඓක්‍යයන් මෙසේය.

| | | | |
|---|---|---|---|
| ගමන් වියදම් | රු. 270 | සංග්‍රහ වියදම් | රු. 520 |
| ලිපි ද්‍රව්‍ය වියදම් | රු. 290 | තැපැල් වියදම් | රු. 60 |

2017.11.30 දිනට සුළු මුදල් පොතේ ශේෂය රු. 360 ක් විය. 2017.11.01 දිනට සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම වනුයේ,

(1) රු. 780 කි. (2) රු. 1140 කි. (3) රු. 1500 කි. (4) රු. 1860 කි.

❖ **ව්‍යාපාරයක ගනුදෙනු සටහන් කිරීමට යොදාගන්නා මූලික සටහන් පොත් කිහිපයක් පහත දැක්වේ. එම මූලික පොත් ඇසුරෙන් අංක 26 සහ 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. මුදල්පොත B. විකුණුම් ජ'නලය C. පොදු ජ'නලය D. ගැණුම් ජ'නලය

(26) 2017.01.01 දින සූරිය ලීබඩු සමාගම රු. 200 000ක ලී බඩු තොගයක් ණයට ගන්නා ලදි. මෙම ගනුදෙනුව සටහන් කිරීමට උපයෝගී කර ගන්නා මූලික පොත කුමක් ද?

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(27) රු. 12000ක ණය ගැතියකු වූ ඉරුෂිකා එම ණය මුදල පියවා නැවත රු. 15000ක භාණ්ඩ ණයට ගන්නා ලදී. මෙම ගනුදෙනුව සටහන් කිරීමට අදාළ උපයෝගී පොත් වනුයේ,

(1) A සහ D ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) A සහ B ය.

(28) පහත සඳහන් ලෙජර් ගිණුම් ශේෂවල දැකිය හැකි අසාමාන්‍ය අයිතමය කුමක් ද?

(1) ණය ගැතියකුගේ ගිණුමේ බැර ශේෂයක් පෙන්වීම.

(2) ලැබූ වට්ටම් ගිණුමේ බැර ශේෂයක් පෙන්වීම.

(3) බැංකු ණය ගිණුමේ බැර ශේෂයක් පෙන්වීම.

(4) ආයෝජන ගිණුමේ හර ශේෂයක් පෙන්වීම.

(29) 2017.10.31 දිනට අයේෂාගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හර ශේෂය රු. 15,600 ක් වූ අතර එදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය මීට වෙනස් විය. වෙනසට හේතු මෙසේය.

- ණයගැති ප්‍රේෂණ රු. 2800 ක් සටහන් නොවීම.
- බැංකු ණය වාරික ගෙවීම් රු. 800 ක් සටහන් නොවීම.
- නිකුත් කළ නමුත් හර නොවූ චෙක්පත්වල වටිනාකම රු. 2400 ක් වීම.
- තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රු. 2000 ක් වීම.

2017.10.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වනුයේ,

(1) රු. 136000 කි. (2) රු. 18000 කි.

(3) රු. 17600 කි. (4) රු. 20000 කි.

(30) ණයගැතියකු වන නෙතුකිගේ ගිණුමේ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2016.01.01 ශේෂය ඉ/ගෙ | | රු. 24 000 |
| වර්ෂය තුළ සිදු වූ ගනුදෙනු | | |
| | දුන් වට්ටම් | රු. 1200 |
| | බොල් ණය කපා හැරීම් | රු. 480 |
| | ලැබුණු මුදල් | රු. 12320 |

2016.12.31 දිනට ණයගැති ගිණුමේ ශේෂය වනුයේ,

(1) රු. 11200 කි. (2) රු. 11480 කි.

(3) රු. 10480 කි. (4) රු. 10000 කි.

(31) ක්ෂයවීම් ගණනය කිරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිත කරන ව්‍යාපාරයක, මිලට ගත් මෝටර් රථයකට අදාළ තොරතුරු ඔබට සපයයි.

| | |
|---|---|
| ඵලදායි ජීවකාලය | අවුරුදු 10 |
| සුන්බුන් වටිනාකම | රු. 5000 |
| වාර්ෂික ක්ෂයවීම් | රු.14500 |

මෝටර් රථයේ පිරිවැය වනුයේ,

(1) රු. 140000කි. (2) රු. 145000කි.

(3) රු. 150000කි. (4) රු. 155000කි.

(32) පාසල් බෑග් නිෂ්පාදනය කරන කර්මාන්තශාලවක මාසික නිෂ්පාදිත බෑග් ප්‍රමාණය 200ක් වූ අතර ප්‍රාථමික පිරිවැය රු. 20000 කි. මුළු නිෂ්පාදන පිරිවැය රු. 80000කි. බෑගයක් 10%ක ලාභයක් තබා ගනිමින් අලෙවි කිරීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත.
පාසල් බෑගයක පිරිවැය සහ විකුණුම් මිල අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) රු. 100, රු. 110 කි (2) රු. 300, රු. 330 කි.

(3) රු. 400, රු. 440 කි. (4) රු. 500, රු. 550 කි.

(33) දුන් වට්ටම් රු. 300 ක් ලැබූ වට්ටම් ලෙස සටහන් කර ඇත. එම වරද නිවැරදි කිරීමේ දී අවිනිශ්චිත ගිණුමට හර හෝ බැර කළයුතු වටිනාකම වනුයේ,

(1) රු. 300 ක් හර කළ යුතුය.
(2) රු. 300 ක් බැර කළ යුතුය.
(3) රු. 600 ක් හර කළ යුතුය.
(4) රු. 600 ක් බැර කළ යුතුය.

- එක්සත් යෞවන ක්‍රීඩා සමාජයේ 2016 වර්ෂයේ සාමාජික සංඛ්‍යාව 100 දෙනෙකු වන අතර, එක් අයකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 75 කි. 2016 වර්ෂය තුළ දී සාමාජිකයින් 80 දෙනෙකු වාර්ෂික සාමාජික ගාස්තුව ගෙවා ඇත.

(34) මෙම ක්‍රීඩා සමාජයේ 2016 වර්ෂයේ සාමාජික මුදල් ආදායම සහ හිඟ සාමාජික මුදල අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,

(1) රු. 7,500, රු. 1,500 කි.
(2) රු. 72,000, රු. 18,000 කි.
(3) රු. 90,000, රු. 18,000 කි.
(4) රු. 97,500, රු. 19,500 කි.

- **පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක 35 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ඉෂිතාගේ ව්‍යාපාරයේ 2016.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

<u>ශේෂ පිරික්සුම</u>

| | හර (රු) | බැර (රු) |
|---|---|---|
| බඩු තොගය (2016.01.01 දිනට) | 40 000 | |
| විකුණුම් | | 320 000 |
| ගැනුම් | 160 000 | |
| ගෙන ඒමේ කුලී | 4000 | |
| පැටවුම් කුලී | 2000 | |
| මෝටර් රථ (පිරිවැය) | 200 000 | |
| මෝටර් රථ ක්ෂය වෙන්කිරීම් (2016.01.01 දිනට) | | 10 000 |
| 10% බැංකු ණය | | 50 000 |
| ණය ගැතියෝ සහ ණය හිමියෝ | 30 000 | 10 000 |
| බැංකු අයිරාව | | 4000 |
| සේවක වේතන | 12000 | |
| වරිපනම් හා විදුලි ගාස්තු | 18000 | |
| දුන් වට්ටම් හා ලැබූ වට්ටම් | 3500 | 6000 |
| ගෙවූ බැංකු ණය පොලී | 2500 | |
| අත ඉතිරි මුදල් | 10 000 | |
| ප්‍රාග්ධනය | | 82 000 |
| | 482 000 | 482 000 |

අතිරේක තොරතුරු :

- මෝටර් රථ, වර්ෂයකට 5% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
- 2016.12.31 දිනට ඉතිරි වූ බඩු තොගය රු. 14000කි.
- ණය ගැතියන්ගෙන් 2%ක් බොල් ණය ලෙස කපා හැරිය යුතුය.

(35) මෙම ව්‍යාපාරයේ 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වනුයේ,

(1) රු. 128 000 කි. (2) රු. 192 000 කි. (3) රු. 194 000 කි. (4) රු. 206 000 කි.

(36) මෙම ව්‍යාපාරයේ 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා දළ ලාභය කොපමණ ද?

(1) රු. 12 000 කි. (2) රු. 128 000 කි. (3) රු. 136 000 කි. (4) රු. 154 000 කි.

(37) 2016.12.31 දිනට ජංගම වගකීම් යටතේ සටහන් කරනු ලබන උපචිත බැංකු ණය පොලිය වනුයේ,

(1) රු. 2 500 කි. (2) රු. 4 500 කි. (3) රු. 5 000කි. (4) රු. 7 500 කි.

(38) මෙම ව්‍යාපාරයේ 2016.12.31 දිනට මෝටර් රථවල සමුච්චිත ක්ෂයවීම් වටිනාකම සහ ධාරණ අගය වන්නේ,

(1) රු. 20 000, රු. 220 000 කි. (2) රු. 10 000, රු. 210 000 කි.

(3) රු. 10 000, රු. 200 000 කි. (4) රු. 20 000, රු. 180 000 කි.

(39) මෙම ව්‍යාපාරයේ 2016.12.31 දිනට මුළු වගකීම්වල වටිනාකම සහ මුළු වත්කම්වල අගය වනුයේ,

(1) රු. 66 500, රු. 233 400 කි. (2) රු. 72 500, රු. 219 400 කි.

(3) රු. 74 500, රු. 204 000 කි. (4) රු. 86 500, රු. 94 400 කි.

(40) මෙම ව්‍යාපාරයේ 2016.12.31 දිනට හිමිකම්වල අගය වනුයේ,

(1) රු. 176 900 කි. (2) රු. 166 900 කි.

(3) රු. 149 900 කි. (4) රු. 129 900 කි.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / **Paper**: I, II |

සැලකිය යුතුයි:

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

❖ **පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (1) සිට (10) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(01) ඇගලුම් ක්ෂේත්‍රයේ රැකියාවක නිරත වූ සරණි සහ ඇයගේ මිතුරියක වූ සසිනි එක්ව 2017.01.01 දින රු. 40,000 බැගින් ප්‍රාග්ධනය යොදවමින් ''සරසි මදුරු දැල් නිපයුම්'' නමින් සෞඛ්‍ය ආරක්ෂිත ඉහළ ප්‍රමිතියෙන් හා ගුණාත්මයෙන් යුතු මදුරු දැල් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ජනාකීර්ණ පරිසරයක කුලියට ගත් ගොඩනැගිල්ලක ආරම්භ කරන ලදි. නිෂ්පාදිත, ජංගම රථ මගින් අලෙවි කිරීමට එකඟතාවයක් ඇති විය. අලෙවියෙන් ලැබෙන මුදල් බැංකු ගත කර චෙක්පත් මගින් ගනුදෙනු කිරීමට ගිවිස ගත්හ. මූල්‍ය ශක්තිය වර්ධනය කර ගැනීමට රු. 60,000 ක බැංකු ණය මුදලක් 2017.01.01 දින 10%ක වාර්ෂික පොලියට ලබාගන්නා ලදි.
2017 ජනවාරි මාසය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | රු. |
|---|---|
| අත්පිට ගැනුම් | 50 000 |
| ප්‍රවාහන ගාස්තු | 20 000 |
| මැෂින් මිලට ගැනීම | 60 000 |
| ගෙවූ මාසික ගොඩනැගිලි කුලී | 4000 |
| ගෙවූ මාසික විදුලි ගාස්තුව | 6000 |
| අත්පිට විකුණුම් | 100 000 |
| ණයට විකුණුම් | 60 000 |
| බැංකුවේ තැන්පත් කිරීම් | 40 000 |

❖ මැෂින් වාර්ෂිකව 5% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

(1) (අ) 'සරසි මදරු දැල් නිපයුම්' ව්‍යාපාරය කුමන, ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත්දැයි නම් කර ඒ ඒ ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් ලියන්න.

(ආ) ''සරසි මදුරු දැල් නිපයුම්' ව්‍යාපාර නාමය ලියා පදිංචි කල යුතු ආයතනය හා ප්‍රඥප්තිය සඳහන් කරන්න.

(2) (අ) චෙක්පත් මගින් ගනුදෙනු කිරීම සඳහා ආරම්භ කළයුතු ගිණුම් වර්ගය නම් කර එම ගිණුම ආරම්භ කළ යුත්තේ කුමන බැංකුවකදැයි දක්වන්න.

(ආ) ''සරසි මදුරු දැල් නිපයුම්' ව්‍යාපාරය අයත් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසියක් සහ අවාසියක් දක්වන්න.

(3) (අ) නිෂ්පාදිත, ජංගම රථ මගින් අලෙවි කිරීම අයත් සිල්ලර වෙළඳ ව්‍යාපාර වර්ගය කුමක් ද?

(ආ) ඉහළ ප්‍රමිතියෙන් යුතුව මදුරු දැල් පාරිභෝගිකයන්ට සැපයීමට අපේක්ෂා කිරීම කුමන කළමනාකරණ කාර්යට අයත්වේ ද?

(4) ඉහත සිද්ධිය ඇසුරෙන් ''සරසි මදුරු දැල් නිපයුම්'' අලෙවිය වැඩි වීමට හේතු විය හැකි කරුණු දෙකක් සඳහන් කරන්න.

(5) මෙම ව්‍යාපාරය පිළියෙල කළ යුතු මූලික පොත් දෙකක් සඳහන් කරන්න.

(6) 2017.01.01 දිනට මූලික ගිණුම්කරණ සමීකරණය අගයයන් සහිතව ලියන්න.

(7) (අ) 2017.01.01 දින ලබාගත් බැංකු ණය මුදල් සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන් අගයන් සහිතව ලියා දක්වන්න.

(ආ) 2017 ජනවාරි මාසයේ බැංකු ණය පොලිය සහ මැෂින්වල ක්ෂය වීම් ගණනය කරන්න.

(8) 2017.01.31 දිනට ව්‍යාපාරයේ ඉතිරි මුදල කොපමණ ද?

(9) (අ) 2017.01.31 දිනෙන් අවසන් මාසයට ව්‍යාපාරයේ ශුද්ධ ලාභය කොපමණ ද?

(ආ) 2017.01.31 දිනට හිමිකම් ගණනය කරන්න.

(10) 2017.01.31 දිනට මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්වල ධාරණ අගය කොපමණ ද?

(ලකුණු 2 × 10 = 20)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය.

❖ **ප්‍රශ්න දෙකකට පහණක් පිළිතුරු සපයන්න.**

(02) (1) (අ) මිනිස් අවශ්‍යතා හා වුවමනා අතර දක්නට ලැබෙන එක් ලක්ෂණය බැගින් ලියන්න.

(ආ) ව්‍යාපාර සඳහා ඇල්මැති පාර්ශවයක් වන සේවකයන්ගේ අරමුණක් ලියන්න.

(ලකුණු 02)

(2) පහත දක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක පැවැත්ම රඳා පවතින්නේ ගනුදෙනුකරුවන් මතය.

(ආ) අරමුණු අනුව ව්‍යාපාර ප්‍රධාන වශයෙන් ලාභ අරමුණු සහිත හා ලාභ අරමුණු රහිත වශයෙන් වර්ග කරයි.

(ඉ) ව්‍යාපාර සඳහා බදු සහන ලබා දීම ව්‍යාපාරයකට ශක්තියකි.

(ඊ) අලෙවියට ඉදිරිපත් කරන නව භාණ්ඩ හඳුන්වා දෙනු ලබන්නේ තොග වෙළෙන්දු පමණි. (ලකුණු 02)

(3) වේවැල්දෙණිය වේවැල් නිෂ්පාදනය සඳහා සුදුසු භෞතික සම්පත් ඇති ප්‍රදේශයකි. මෙම ප්‍රදේශයේ ජීවත්වන නිමල් වේවැල් මගින් විසිතුරු භාණ්ඩ නිර්මාණය කිරීමට දක්ෂතාවයක් දක්වයි. මේ සඳහා ඔහුට මූල්‍ය ආයතනයකින් ණය ලබා දීමටද කැමැත්ත පළ කර ඇත.

(අ) ඉහත සිද්ධියට අනුව ශක්තියක් ලියන්න.

(ආ) බාහිර පරිසර සාධකයක් ලියන්න. (ලකුණු 02)

(4) (අ) නිෂ්පාදන සාධක උදාහරණ සහිතව නම් කරන්න.

(ආ) ව්‍යාපාර සඳහා රජය විසින් නීති රීති පැනවීමේ අරමුණු සඳහන් කරන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 08)

(03) (1) (අ) සිල්ලර වෙළඳාම හා තොග වෙළඳාම අතර දක්වෙන වෙනස්කම් දෙකක් ලියන්න.

(ආ) උපකාරක සේවා හතරක් නම් කරන්න. (ලකුණු 02)

(2) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) දේපල රක්ෂණ ඔප්පුවක වටිනාකම තීරණය වන්නේ රක්ෂිතයාගේ කැමැත්ත මතය.

(ආ) ජංගම ගිණුමක් ආරම්භ කිරීමෙන් ව්‍යාපාරිකයකුට චෙක්පත් මෙන්ම ණයපත් මගින් ද ගණුදෙනු කිරීමේ වාසිය අත්වේ.

(ඇ) බැංකු හා රූපලාවන්‍ය ආයතන සේවා සැපයීමේ ව්‍යාපාරවලට අයත් නොවේ.

(ඊ) අනෙකුත් ව්‍යාපාර වලට සාපේක්ෂව ඒක පුද්ගල හා හවුල් ව්‍යාපාරවලට බලපාන නීති අවම වේ. (ලකුණු 02)

(3) ඇඳුම් නිෂ්පාදනයේ යෙදී සිටින ධනවර්ධන කිරිබත්ගොඩ ලංකා බැංකුවේ ජංගම ගිණුම් හිමියෙකි. ඔහු කොළඹ සිටින වසන්ත රණතුංගට අමුද්‍රව්‍ය ගැනුම් සඳහා මුදල් ගෙවීමට රු. 150 000 ක චෙක්පතක් 2017.09.26 දින ලියා නිකුත් කරන ලදි. මෙම චෙක්පත 'ආදායකයාගේ ගිණුමට පමණි'යනුවෙන් රේඛනය කරන ලදි.

(අ) ඉහත තොරතුරු පදනම් කරගෙන චෙක්පතක් අඳින්න.

(ආ) චෙක්පත් රේඛනය මගින් ලබාගත හැකි වාසි දෙකක් ලියන්න. (ලකුණු 02)

(4) සෙවනගම පදිංචි කවීෂ හා මනීෂ ගොවීන්ට වාසි දීමේ අරමුණින් ගොවීන් දහසක් සම්බන්ධකර ගනිමින් සාමූහික අයිතිය මෙන්ම සමාජ සංවර්ධනය යන සංකල්ප අගය කරමින් ව්‍යාපාරයක් අරඹන ලදි.

(අ) කවීෂ සහ මනීෂ ආරම්භ කල ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ආ) මෙම ව්‍යාපාර සංවිධානයේ ලක්‍ෂණ දෙකක් දක්වන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 2 × 4 = 8)

(04) (1) විශ්‍රාමික රාජ්‍ය සේවකයෙකු වූ ආනන්ද මහතාට විශ්‍රාම පාරිතෝෂික අරමුදලින් වූ රුපියල් ලක්‍ෂ දහයක් ලැබුණි. මෙම මුදල් ඉහළ පොලී ආදායමක් සහ ආරක්ෂාවක් ලැබෙන ආයෝජන මාර්ගයක ආයෝජනය කිරීමට ඔහු අදහස් කරයි.

(අ) මේ සඳහා සුදුසු විකල්ප ආයෝජන මාර්ග දෙකක් නම් කරන්න.

(ආ) ඉහත නම් කළ ආයෝජන මාර්ගවල ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 02)

(2) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) සීමාසහිත සමාගමක ප්‍රාග්ධනය සමාන පංගුවලට බෙදුවහොත් ඉන් එක් පංගුවක් කොටසක් ලෙස හඳුන්වයි.

(ආ) ශ්‍රී ලාංකික නිමි ඇඳුම් නිෂ්පාදිත, යුරෝපීය රටවල විකිණීම අපනයන වෙළඳාමට නිදසුනකි.

(ඉ) ව්‍යාපාරයක අරමුණු තීරණය කිරීම හා ඒවා ඉටුකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග තීරණය කිරීම සම්බන්ධ ක්‍රියාවලිය සැලසුම්කරණයයි.

(ඊ) ශ්‍රී ලංකාව තුළ සිදුකරන ඕනෑම ආයෝජනයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියා පදිංචි කළ යුතුය. (ලකුණු 02)

(3) නිවාස ඉදිකර අලෙවි කිරීමේ ව්‍යාපාරයක නියුතු ඩයස් විසින් පහත සඳහන් කාර්යයන් ඔබට ඉදිරිපත් කරයි.

A - ඉඩම්, අමුද්‍රව්‍ය, සේවකයන් හා කළමනාකරුවන් ප්‍රමාණය තීරණය කිරීම.

B - කළමනාකරුවන්ට හා සේවකයන්ට අවශ්‍ය සම්පත් ලබා දීම.

C - තමාගේ සැලසුම්වලට අදාළව නිවාස අලෙවි කර ඇත්දැයි සොයා බැලීම.

D - කළමනාකරුවන්ට හා සේවකයන්ට අවශ්‍ය තොරතුරු ලබා දීම.

(අ) ඉහත සඳහන් තොරතුරු කළමනාකරණ කාර්යයන්ට අදාළ වන ආකාරයට පිළිවෙලින් පෙල ගස්වන්න.

(ආ) එම එක් එක් තොරතුරට අදාළ කළමනාකාරණ කාර්යය නම් කරන්න. (ලකුණු 02)

(4) (අ) දැක්වෙන අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් නම් කරන්න.
(ආ) ඉලක්ක වෙළඳපොළ කෙටියෙන්පැහැදිලි කරන්න. (ලකුණු 02)
(මුළු ලකුණු 2 × 4 = 08)

## II කොටස

(05) (1) (අ) ගිණුම්කරණය අවශ්‍ය වන්නේ ඇයි?
(ආ) පහත සඳහන් සමීකරණයේ හිස්තැනට සුදුසු වචනය යොදා නැවත ලියන්න.

හිමිකම් = ...................................... - වගකීම් (ලකුණු 02)

(2) නිසලගේ සිල්ලර වෙළඳ ව්‍යාපාරයේ 2016 නොවැම්බර් මාසයට අදාළ ණයට ගැනුම් විස්තර පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 2016.11.05 | 82 | සරත් | 5000 |
| 2016.11.08 | 35 | කමල් | 3000 |
| 2016.11.10 | 18 | සිරිසේන | 3500 |
| 2016.11.20 | 110 | කමල් | 2500 |

◆ අවශ්‍ය වන්නේ:
තරිඳුගේ ව්‍යාපාරයේ 2016 නොවැම්බර් මාසයේ ගැනුම් ජ'නලය. (ලකුණු 02)

(3) රවීගේ ව්‍යාපාරයේ 2016 මාර්තු මාසය තුළ දී සිදු වී ඇති ගනුදෙනුවලින් ගිණුම්කරණ සමීකරණයට සිදු වී ඇති බලපෑම පහත පිරිදි දක්වා ඇත.

| ගනුදෙනුව | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| 1 | -45000 | | | | -45000 |
| 2 | +10000 | | +10000 | | |
| 3 | -30000<br>+35000 | | +5000 | | |
| 4 | +70000<br>-70000 | | | | |
| 5 | -5000 | | | | -5000 |

◆ අවශ්‍ය වන්නේ:
(අ) එක් එක් අවස්ථාවල සිදු වී ඇතැයි උපකල්පනය කළ හැකි ගනුදෙනු වටිනාකම් සහිතව ලියා දැක්වීම.
(ආ) ව්‍යාපාරයක පහත සඳහන් අයිතම වලට අදාළ නිදසුන බැගින් දක්වන්න.
1. වත්කම් 2. ජංගම නොවන වගකීම්
3. ජංගම නොවන වත්කම් 4. ජංගම වගකීම් (ලකුණු 04)

(4) චාමරගේ ව්‍යාපාරයේ සුළු මුදල් ගෙවීම් වාර්තා කිරීම සඳහා සුළු මුදල් පොතක් භාවිත කරන අතර ඊට අදාළ තොරතුරු පහත දැක්වේ.
1. සුළු මුදල් අග්‍රිමය රු. 2000කි.
2. ඔක්තෝබර් මාසයේ සුළු මුදල් ගෙවීම්වල එකතුව රු. 1800කි.
3. ඔක්තෝබර් මස 01 දින හා 2016 නොවැම්බර් මස 01 දින සුළු මුදල් ප්‍රතිපූර්ණය සිදු විය.

නොවැම්බර් මාසයේ සුළු මුදල් ගෙවීම් පහත පරිදි වේ.

| දිනය | විස්තරය | මුදල (රු.) |
|---|---|---|
| 2017.11.02 | ගමන් වියදම් | 200 |
| 2017.11.03 | ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | 150 |
| 2017.11.05 | තැපැල් ගාස්තු | 150 |
| 2017.11.08 | සංග්‍රහ වියදම් | 250 |
| 2017.11.15 | මුද්දර සඳහා | 150 |
| 2017.11.20 | මහේන්ට ගෙවීම් | 500 |
| 2017.11.25 | බස් ගාස්තු | 300 |
| 2017.11.28 | පෑන් ගැනීම | 100 |

◆ අවශ්‍ය වන්නේ,
තැපැල් ගාස්තු, ගමන් ගාස්තු, සංග්‍රහ වියදම්, ලිපි ද්‍රව්‍ය වියදම් හා අනෙකුත් ලෙජර් ගිණුම් යන විශ්ලේෂණ තීරු භාවිත කරමින් ඉහත සඳහන් ගනුදෙනු වාර්තා කොට සුළු මුදල් පොත පිළියෙල කිරීම. (ලකුණු 04)

(මුළු ලකුණු 12)

(06) (1) (අ) ''අවිනිශ්චිත ගිණුම'' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 01)

(ආ) විකුණුම්වලින් ලද රු. 5000ක චෙක්පත එම අවස්ථාවේ දීම බැංකුගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න. (ලකුණු 01)

(2) චමත්කාගේ ව්‍යාපාරයේ 2016.11.01 දිනට ණයහිමි ගිණුමේ ශේෂය රු. 28,000කි.

2016.11.07 ණය හිමියන්ට ගෙවූ මුදල 9500ක් වූ අතර ලද වට්ටම රු. 500
2016.11.05 ණය හිමියන්ට රු. 15000ක ණය ගෙවීමේ දී අඩු කළ වට්ටම 10%කි.

◆ ඉහත ගනුදෙනු ණයහිමි ගිණුමේ සටහන් කර 2016.12.01 දිනට ණයහිමි ගිණුමේ ශේෂය පෙන්වන්න. (ලකුණු 02)

(3) අනුහස්ගේ ව්‍යාපාරයේ 2017 අගෝස්තු මාසය සඳහා පිළියෙල කළ බැංකු ගිණුම පහත දැක්වේ.

බැංකු ගිණුම

| දිනය | ලා. අ. | විස්තරය | ස. අ. | වටිනාකම රු. | දිනය | ව. අ. | විස්තරය | ස. අ. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 17.08.01 | | ශේ/ඉ/ගෙ | | 60000 | 17.08.06 | | චෙක් - 3721 | | 15000 |
| 17.08.05 | | මුදල් තැන්පත් | | 10000 | 17.08.12 | | චෙක් - 3722 | | 4500 |
| 17.08.10 | | චෙක් තැන්පත් | | 7500 | 17.08.15 | | චෙක් - 3723 | | 6000 |
| 17.08.18 | | චෙක් තැන්පත් | | 3500 | 17.08.20 | | චෙක් - 3724 | | 2000 |
| 17.08.26 | | චෙක් තැන්පත් | | 2500 | 17.08.27 | | චෙක් - 3725 | | 4000 |
| | | | | | 17.08.31 | | ශේ/ප/ගෙ | | 52000 |
| | | | | 83500 | | | | | 83500 |

අනුහස්ගේ ව්‍යාපාරයට බැංකුව විසින් එවනු ලැබූ 2017 අගෝස්තු මාසයට අදාළ බැංකු ප්‍රකාශය පහත දැක්වේ.

| දිනය | විස්තරය | ගෙවීම් රු. | ලැබීම් රු. | ශේෂය රු. |
|---|---|---|---|---|
| 2017.08.01 | ශේ/ ඉ/ ගෙ | - | - | 60000 |
| 2017.08.05 | මුදල් තැන්පතු | - | 10000 | 70000 |
| 2017.08.09 | චෙක් ගෙවීම් - 3721 | 15000 | - | 55000 |
| 2017.08.13 | චෙක් තැන්පත් | - | 7500 | 62500 |
| 2017.08.15 | චෙක් ගෙවීම් - 3722 | 4500 | - | 58000 |
| 2017.08.17 | චෙක් ගෙවීම් - 3723 | 6000 | - | 52000 |
| 2017.08.21 | චෙක් තැන්පත් | - | 3500 | 55500 |
| 2017.08.25 | චෙක් ගෙවීම් - 3724 | 2000 | - | 53500 |
| 2017.08.27 | බැංකු ගාස්තු හා දඩ | 3000 | - | 50500 |
| 2017.08.30 | ප්‍රේෂණ - ලාභාංශ | - | 5750 | 56250 |

◆අවශ්‍ය වන්නේ,

(අ) බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම. (ලකුණු 02)

(ආ) බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම. (ලකුණු 02)

(4) රවීන්ගේ ව්‍යාපාරයේ 2017/08/31 දිනට සකස් කළ ශේෂ පිරික්සුම තුලනය නොවූ හෙයින් එහි වෙනස අවිනිශ්චිත ගිණුමක සටහන් කරන ලදි. පසුව සොයාගත් වැරදි මෙසේ ය.

1. රක්ෂණ ගාස්තු ලෙස ගෙවූ රු. 2500ක් මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.
2. ප්‍රචාරණ වියදම් ලෙස ගෙවූ රු. 4750ක ශේෂය ශේෂ පිරික්සුමේ සටහන් කර නැත.
3. ණය හිමියන්ට ගෙවූ රු. 7000ක මුදල ගිණුම්වල දෙවරක් සටහන් කර ඇත.
4. ලැබූ ගෙවල් කුලී රු. 6000 ලැබූ ගෙවල් කුලී ගිණුමේ සටහන් කර ඇත්තේ රු. 600ක් ලෙසය.

◆අවශ්‍ය වන්නේ,

(අ) වැරදි නිවැරදි කිරීමේ ජ'නල සටහන්

(ආ) වැරදි නිවැරදි කිරීමෙන් පසු අවිනිශ්චිත ගිණුම (ලකුණු 04)

(මුළු ලකුණු 12)

(07) (1) (අ) බොල් ණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) වත්කමකින් වර්ෂයක් තුළ කොපමණ ප්‍රමාණයක් ක්ෂය කරන්නේදැයි තීරණය කිරීමට බලපාන සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) පහත දැක්වෙන්නේ දිලෙනතරු ක්‍රීඩා සමාජයේ 2017 මුල් මාස 2 සඳහා ලැබීම් හා ගෙවීම් පිළිබඳ භාණ්ඩාගාරික තැබූ සටහන්වලින් උපුටාගත් තොරතුරුය.

| | | |
|---|---|---|
| 2017.01.01 | අත ඉතිරි මුදල | රු. 2400 |
| 2017.01.05 | සාමාජික මුදල් | රු. 2700 |
| 2017.01.10 | විදුලිය ගාස්තු | රු. 1200 |
| 2017.01.15 | බදු හා වරිපනම් | රු. 500 |
| 2017.01.20 | සාමාජික මුදල් | රු. 1300 |
| 2017.01.23 | පරිත්‍යාග ලැබීම් | රු. 3000 |
| 2017.01.27 | සාමාජික මුදල් | රු. 2500 |

| | | |
|---|---|---|
| 2017.02.03 | ලිපි ද්‍රව්‍ය | රු. 1700 |
| 2017.02.10 | පත්තර සඳහා | රු. 1500 |
| 2017.02.12 | විදුලි ගාස්තු | රු. 1300 |
| 2017.02.15 | බදු හා වරිපනම් | රු. 700 |
| 2017.02.20 | සාමාජික මුදල් | රු. 2000 |
| 2017.02.25 | පරිත්‍යාග ලැබීම් | රු. 1500 |

- ඉහත තොරතුරු ඇසුරෙන් 2017.02.28 දිනට ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කර එදිනට මුදල් ශේෂය ගණනය කරන්න. (ලකුණු 02)

(3) රුහිගේ ව්‍යාපාරයේ 2016.12.31 දිනට පිළියෙළ කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 400000 |
| ගැනුම් | 175000 | |
| විකුණුම් | | 280000 |
| බඩු තොගය (2016/01/01) | 5000 | |
| ගෙන ඒමේ කුලී | 4000 | |
| ණය ගැතියෝ | 55000 | |
| ණය හිමියෝ | | 17000 |
| 10% බැංකු ණය | | 50000 |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට) | 400000 | |
| උපකරණ (පිරිවැයට) | 150000 | |
| 2016-01-01 දිනට ක්ෂය වෙන්කිරීම් | | |
| ගොඩනැගිලි | | 80000 |
| උපකරණ | | 30000 |
| දුන් වට්ටම් | 3500 | |
| ලද වට්ටම් | | 8000 |
| බැංකු ණය පොළී | 3000 | |
| රක්ෂණය | 7500 | |
| පරිපාලන වේතන | 12000 | |
| ප්‍රදාරණය | 12500 | |
| වරිපනම් | 2500 | |
| බැංකු ශේෂය | 20000 | |
| මුදල් ශේෂය | 15000 | |
| | 865000 | 865000 |

අමතර තොරතුරු

- 2016/12/31 දිනට බඩු තොගය රු. 25000යි.
- ගොඩනැගිලි හා උපකරණ 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
- ණයගැතියන්ගෙන් රු. 5000ක් බොල් ණය ලෙස කපා හරින්න.
- වරිපනම් රු. 500 ක් උපචිතව ඇත.

◆ අවශ්‍ය වන්නේ,

(අ) 2016/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය (ලකුණු 04)

(ආ) 2016/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ලකුණු 04)

(මුළු ලකුණු 12)